# පාලකයන්ගේ සාක්කුවලට මුදල් ලැබෙන ආකාරයට තමා ජාත්‍යන්තරය සමග

# කිසිවිටක ගනුදෙනු කරන්නේ නෑ

## – නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සජිත් ප්‍රේමදාස

**අමිත් මධුරංග**

පාලකයන්ගේ සාක්කුවලට මුදල් ලැබෙන ආකාරයට තමා ජාත්‍යන්තරය සමග කිසිවිටක ගනුදෙනු නොකරන බව නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සජිත් ප්‍රේමදාස මහතා පැවසීය.

අමාත්‍යවරයා මේ බව පවසා සිටියේ නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී ඊයේ (26දා) පැවැති මාධ්‍ය හමුවකට සහභාගි වෙමිනි.



අපේකම, ගමේකම, සංස්කෘතිය හා සහෘදත්වය ආරක්ෂා ලෙසත්, මෙරට පුරවැසියාට වැඩිම ප්‍රතිලාභයක්, අභිමානයක් හා ගෞරවයක් හිමිවන ලෙසත් තමා ජාත්‍යන්තරය සමග ගනුදෙනු කරන බවද ඇමතිවරයා සඳහන් කළේය.

පසුගිය රජය සමයේ දුප්පත්කමේ ප්‍රතිශතය පහළ ගියේ ජන හා සංඛ්‍යාලේඛන 'පිල්මාට්' හේතුවෙන් බවත්, එම චෝදනා ඔප්පු කර ලොවටම සත්‍යය හෙළි කරන බවත් ඇමතිවරයා සඳහන් කළේය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ සජිත් ප්‍රේමදාස මහතා,

"හොඳම උදාහරණය නම් ලෝක බැංකුවෙන් පළමුවරට මගේ පියාගේ 'ජනසවි' වැඩසටහන සඳහා ජනසවි භාරකාර අරමුදලට ප්‍රදානයක් ලබා දුන්නා. එය ණයක් නොව ආධාරයක්. අපේ රටේ මානව හිතවාදී, රටට ආදරෙයි කියා ගන්නා පිරිස සූට්කේස් පුරවාගෙන, රටේ පේලාම් ලිපි ටික අරගෙන ජිනීවා ගිහින් රටට ආධාර දෙන්න එපා කියූ කාලයකයි මගේ පියාණන් ලෝක බැංකුවෙන් ආධාර ලබා ගත්තේ.

මටත් පිටරටවලින් ගිනි පොලියට ණය ලබා ගන්නේ නැතුව මාගේ පියා වගේම රටට ආධාර ලබා ගෙන රට සංවර්ධනය කිරීමේ හැකියාව තිබෙනවා.

පසුගිය රජය දුගී දුප්පත්කම ගැන ව්‍යාජ සංඛ්‍යාලේඛන හා තොරතුරු නිර්මාණය කර ඉදිරිපත් කළේ, රටේ ජනතාව සැනසීමට හා ජාත්‍යන්තරය තුළ ප්‍රසිද්ධියක් ලබා ගැනීමටයි. මා කැමතියි එය සංඛ්‍යාත්මකව ඉදිරිපත් කරන්න. මෙයින් ඔබට තේරුම් යාවි ඔවුන් සිදුකළ අංක ගණිත පිල්මාට් එක.

මෙරට සමස්ත පවුල් ප්‍රමාණයෙන් දළ වශයෙන් 28%ත් 31%ත් අතර ප්‍රමාණයක් සමෘද්ධි ප්‍රතිලාභ ලබනවා. නමුත් ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දත්තවල සඳහන් වන්නේ මෙරට දුප්පත්කමේ ප්‍රතිශතය 6.5%ත් 8.9%ත් අතර බවයි.

2012 ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දත්තවලට අනුව එම වසරේ ලංකාවේ සමස්ත පවුල් ගණන ලක්ෂ 52යි. ඉන් පවුල් ලක්ෂ 15ක් සමෘද්ධිය ලබනවා. එහි ප්‍රතිශතය 29.4%ක්. නමුත් එම වසරේ දුප්පත්කමේ ප්‍රතිශතය 6.5%යි. දුප්පත්කමේ ප්‍රතිශතයට වඩා 23%කට සමෘද්ධිය ලබා දෙනවා. එම නිසා මෙම දුප්පත්කමේ ප්‍රතිශත ව්‍යාජ ඒවා බව මා පැහැදිලිව සඳහන් කරනවා. ඔවුන් මේවා නිර්මාණය කර ඇත්තේ ජනතාව තුළ කෘත්‍රිම සැනසිලි බවක් ඇති කරන්නයි. ඇත්ත කතාව නම් එම වසරේ අපේ රටේ දුප්පත්කමේ ප්‍රතිශතය 29%ක් විය යුතුයි. නමුත් ඔවුන් ඇත්ත කතාව හැංගුවා. ඇත්ත කතාව හංගපු නිසා ලෝකය අපිව දැක්කේ දුප්පත්කම අඩු වුණු රටක් ලෙසයි" යනුවෙන් පවසා සිටියේය.